මගේ අංකය
எனது இல
My No.

ඔබේ අංකය
உனது இல
Your No.

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

දුරකථනය
தொலைபேசி
Telephone Nos
**2777327 / 2777287**
**2777100** **(Ext: 6654/3201/5304)**

විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
E - Mail
**news@parliament.lk**

ෆැක්ස්
தொலை நகல்
Fax
2777327

**සන්නිවේදන දෙපාර්තමේන්තුව/ தொடர்பாடல் திணைக்களம் / Department of Communication**

ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ / ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே / Sri Jayewardenepura, Kotte

**2024.02.01**

<u>මාධ්‍ය නිවේදනය</u>

**මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතට කථානායකවරයාගේ සහතිකය හිමි වෙයි**

- **ජාතික ජලශාස්ත්‍රීය පනත් කෙටුම්පතට සහ අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පනත් කෙටුම්පතටත් කථානායකවරයාගේ සහතිකය…**

පසුගිය ජනවාරි 23 සහ 24 දෙදින පාර්ලිමේන්තුවේ විවාද කිරීමෙන් අනතුරුව සංශෝධන සහිතව සම්මත කරනු ලැබූ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතට අද (01) කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සිය සහතිකය සටහන් කළේය.

ඒ අනුව මෙම පනත් කෙටුම්පත 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත ලෙස බලාත්මක වේ.

එමෙන්ම පාර්ලිමේන්තුවේ විවාද කොට සංශෝධන සහිතව ජනවාරි 09 දින සම්මතවූ ජාතික ජලශාස්ත්‍රීය සහ ජනවාරි මස 10 වැනි දින සම්මතවූ අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පනත් කෙටුම්පත් ද්විත්වයට ද මෙහිදී කථානායකවරයාගේ සහතිකය හිමිවිය.

ඒ අනුව උක්ත පනත් කෙටුම්පත් 2024 අංක 7 දරන ජාතික ජලශාස්ත්‍රීය පනත සහ 2024 අංක 8 දරන අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පනත ලෙස බලාත්මක වනු ඇත.

එච්.ඊ. ජනකාන්ත සිල්වා,
අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා / අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩ බලන)
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.072 366 9163